ආචාර්ය
පාලිත ගනේවත්ත

සද්ධර්ම රත්නාවලියේ සාහිත්‍යමය අගය

සාහිත්‍ය සමීක්ෂණ 7

පසුගිය සාහිත්‍ය සමීක්ෂණ තීරයෙන් අප උත්සාහ දරාරුවේ සද්ධර්ම රත්නාවලියේ භාෂා විලාසයේ විශේෂ ලක්ෂණ ගැන අවධානය යොමු කිරීමටය.

සද්ධර්ම රත්නාවලියේ විවේක බුද්ධියෙන් යුතුව කියවීමේදී පෙනී යන එක් වැදගත් කරුණක් නම් සිංහල කතා කලාවේ වර්ධනයට එයින් මහත් පිටුවහලක් ලැබී ඇති බවයි. සිංහල නවකතාව හා කෙටිකතාව බටහිරින් නයට ගත්තක් ලෙස සර්විදන්ද්‍රයන් වැනි වියතුන් පළ කළ මතයට විරුද්ධව මත රාශියක් සිංහල සාහිත්‍ය විචාරකයන් විසින් ඉදිරිපත් කර තිබේ. මෙයින් මුල් තැන ගන්නේ මාර්ටින් වික්‍රමසිංහ ඉදිරිපත් කළ මතයයි. එනම් සිංහල නවකතාව හා කෙටිකතාව සිංහලයනට උරුම වූ කතා කීමේ හැකියාවේ අවිච්ඡින්න පරිනාමයක් බවයි. මේ සඳහා වික්‍රමසිංහයන් සාධක සහිතව ඔප්පු කළේ ජාතක කතා වල ඇති වස්තු බීජ නවකතා හා කෙටිකතා වලට සමානත්වයක් දැක්වීමයි. ජාතක කතා වලට බෙහෙවින් සමාන හා ඊටත් වඩා සිංහල ගැමි වහර ඇසුරු කරගෙන ධර්මසේන යතිවරයන් ලියූ සද්ධර්ම රත්නාවලියේ බොහෝ කතා වස්තූන් විකාශණය කර ඇති ආකාරය විමසා ලබන්නකුට එම කතා වස්තු විකාශණය කර ඇති ආකාරය වර්තමාන කෙටිකතා වලට බෙහෙවින් සමාන කමක් දක්වන බව පෙනී යනු ඇත.

සද්ධර්ම රත්නාවලිය රචනා කර ඇත්තේ ධම්ම පදටීඨ කතාවේ සිංහල අනුවාදයක් ලෙසින් වුවද ධර්මසේන හිමියන් කියන්නේ එය ''පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන කරන ලද ප්‍රබන්ධයක් හැටියටය. පාලියෙන් ගත් ගද්‍ය කොටසක පද්‍යානුගත සිංහල පරිවර්තනයක් හා ධර්මසේන හිමියන් එය විකාශණය කළ විදියත් ඝසඳා බලමු.

ධම්ම පදටීඨ කතාවේ මුල් කතාව වන චන්ඩුපාල තෙරුන්ගේ වස්තුවේ මුල් ඡේද දෙකේ සිංහල පරිවර්තනය මෙසේය.
''මේ ධර්ම දේශනාව කොහිදී දෙඩක්ද? ශ්‍රාවස්තියේදී, කවුරුන් අරභයාද? චක්‍රබුපාල තෙරුන් ශ්‍රාවස්තියෙහි වනාහි මහා සුවර්ණ නම් කෙළෙඹියෙක් විය. මහා ධනයෙන් හා මහා භෝගයෙන් ආඪ්‍යය අපුත්‍රකය. හෙතෙම එක් දිනක් නාන තොටට ගොස් නහා එනුයේ අතරමග අතුපතර සහිත එක් නුගරුකක් දැක ''මෙයට මහේශාක්‍ය දේවතාවෙක් අධිගෘහිත වන්නේ '' යැයි සිතා සිය ගිස පෙදෙස සෝදා වට පවුරු තරවා වැළි විසුරුවා ධජයනාක ඔසොවා, නුගය අලංකාර කොට ''පුතෙකු හෝ දුවක'' ලැබ ඕබට මහා සත්කාර කරන්නෙමි'' යි ප්‍රාර්ථනා කොට ගියේය. (කේ. ජයතිලක, සිංහල කතා කලාවේ විකාශනය පි. 55 : 2003 මුද්‍රණය)

> මෙයින් මුල් තැන ගන්නේ මාර්ටින් වික්‍රමසිංහ ඉදිරිපත් කළ මතයයි. එනම් සිංහල නවකතාව හා කෙටිකතාව සිංහලයනට උරුම වූ කතා කීමේ හැකියාවේ අවිච්ඡින්න පරිනාමයක් බවයි. මේ සඳහා වික්‍රමසිංහයන් සාධක සහිතව ඔප්පු කළේ ජාතක කතා වල ඇති වස්තු බීජ නවකතා හා කෙටිකතා වලට සමානත්වයක් දැක්වීමයි.

දැන් ධර්මසේන හිමියන් මේ කොටස සද්ධර්ම රත්නාවලියෙහි ලා විකාශණය කරන සැටි බලමු.

''එකල්හි සැවැත් නුවර මහ සම්පත් ඇති මහාසුමන නම් කෙළඹියාණන් කෙනෙක් වෙසෙති. සම්පත් ඇති පමණ මුත් පල ගන්නා ගස් තමා පල ගන්නා අවධියේ මුත් අතුරෙක පල නොගන්නා සේ, පුත්‍ර ප්‍රතිලාභයට නිසි කුසලය නුමුතුරා ගිය හෙයින් දෝ සම්පත් ප්‍රයෝජන විඳ පියන්ට නිසි දරු කෙනෙකුත් නැත. ඒ කෙළෙඹි පුත්‍රයාණෝ එක් දවසක් ගඟට ගොසින් නා පියා එන තැනැත්තෝ අතුරු මඟ අතු පතරින් ගැවසී ගත් මී දෙව්දුව ඉසට පැන් නගන්ට මුණින් නමා ලූ ඉඳි නිල් මිණිමුවා කළයෙකින් වැම්මෙන ජල ධාරාවක් සේ සුදු කඳක් ඇති නැවත ඒ මී දෙව් දුව ඉසට කළ පිල් සතත් වැනි සෙසු ගස් කොළට උස් හෙයින් දෝ හෝ නොහොත් මල් නැතිව පල ගන්නා හෙයින් වනස්පතී නම් නුග ගස් ආදියෙන් එක්තරා ගසක් දැක, මේ ගස ඉතා ශෝභවත. මෙසේ වූ ගසේක අනුභාව සම්පන්න දේවතා කෙනකුත් ඇත මැතවැ.යි දෙවනා ආරාධනායෙනුත් දරු කෙනකුත් ලදිමි නම් යෙහෙකැයි සිතා ගස මුල තණ හරවා කසළුත් හමද වා බෝධි කොටුවක් සේ වට පවුරකුත් බඳවා ඒ ඇතුළත මුතු පට සමාන වැලි ලවා වට කොට ඔප් පතාක නංවා ගස කඳත් පට කඩ ආදියෙන් සරහා අතුපනත් මල් වඩම් ආදියෙන් සරහාලා 'නව මෙ වනයෙක් නො-වෙයි. දෙවතාවාණෙනි, තොප ගේ අනුභාවයෙන් දරු කෙනකුන් ලදිමි නම් කළ උපකාරයට පුත්‍රප්‍රකාර කොට මහත් සත්කාර කරවමි' කීය. දරුවන් පතාගෙන නුවරට ගියෝ යැ.' '' (කිරිඇල්ලේ ඤාණවිමල සංස්කරණය 5. 32)

පාලියෙන් ගත් කතා වස්තුව විකාශනය කිරීමේදී ධර්මසේන හිමියන් සිංහල ගැමි වහරයත් ගත් උපමා රූපක පමණක් නොව ස්වකීය ප්‍රතිභා ශක්තිය මෙහෙයවා, කතාවට වස්තු වූ අත්දැකීම් වර්ධනය කරන හැටි මේ සංස්කෘදයෙන් වටහා ගත හැකිය.

සද්ධර්ම රත්නාවලියේ එන 'කුම්භඝෝෂක වස්තුව'' කියවන්නකු එය වර්තමාන කෙටි කතාවකටත් වඩා ඉතා ගැර අන්දමින් විකාශනය වී ඇති අයුරු වටහා ගනු ඇතැයි සිතමි.

සිංහල කතා කලාවේ විකාශණයට මෙන්ම වස්තු වර්ණයටද සද්ධර්ම රත්නාවලියේ වර්ණ රිතිය බෙහෙවින් ඉවහල් වී ඇති බව පෙනී යයි. චුන්ද නම් හඳෑ වැද්දාගේ වස්තුවෙන් ගත් පහත දැක්වෙන වර්ණනය කියවන පාඨකයා ඌරු වැද්දා විසිරා ඌරා මරුමුවට පත්කරන සිතුවම කෙතරම් සජීවී ලෙස මවා පාන්නේද?

'''.....වක් කළ හුණුපැන් කුස ඇතුළට වැද කකියමින් කසළ ද් ඇරැගෙන අඩෝමාර්ගයෙන් නික්මෙයි. එසේ නික්මෙන පැන්, යම්තාක් මළ කුද් කසළෙන් බඩ ඇතුළේ ඇත්නම්, කැළඹී එයි. එහි කසළ නැත්නම් ප්‍රසන්නව බාහප වෙයි. ඒ ලෙසින් බඩ ශුද්ධ වූ නියාව දැන සෙසු හුණු පැන් හුරා ගේ පිටැ වත් කෙරෙයි. ඒ කැලෑ කළු සම දවා ගෙන වැගිර යෙයි. ඉක්බිත්තෙන් තණ සුළෙකින් ලොම් දවා පියා කැපෙන යකඩකින් ඉස ගසා පියයි. බොටුවෙන් වැගිරෙන ලේ වළ දෙපැවත් කොට තබා ලා, මස්කැටි ලෙහෙසේ ගලා ගලා ගෙන අඹුදරුවන් පිරිවරා හිඳ කාලා.....'''

ෆිජි කඩේ.. අපේ කඩේ..
Moonee Ponds

* Sri Lankan and Indian Spices and Groceries
* Frozen Fish and Frozen Indian food delicacies
* Sri Lankan Weekly News Papers
* Sinhala, Tamil and Indian Tele-dramas in VHS & Indian Movies in VCDs and DVDs
* Fresh Asian Vegetables
* Sri Lankan Take-away
* Ready to eat meal packs

Jagath.JE

සෑම බ්‍රහස්පතින්දාම
සිංහල එළවළු

We send Money to Sri Lanka
For all your Asian grocery needs.
Come and Talk to friendly staff
at our store.

INDIAN SRI LANKAN GROCERY SHOP
FIJI PRODUCTS
Shop 7/34 Aspen Street
Moonee Ponds 3039
Tel– 03-9370 3813

මාස්ටර් ස්ර

ඔස්ට්‍රේලියාව වෙනුවෙන් ක්‍රීඩා කරපු අර දක්ෂ ක්‍රීඩකයා නොහිටියා නම් ලංකාවෙ ක්‍රිකට් කණ්ඩායමට ලකුණු 22 කින් නෙවෙයි 50 කින් දිනන්න තිබුණා

කව්ද...? බ්‍රෙට් ලී ද.....?

නැහැ..... නැහැ ..... ඩැරල් හාපර්